

# දළදා මාලිගාව ළඟ අලි වධයක්!

**ම**ම මේ රටේ ගුරුසේවයේ කාලයක් යෙදී සිටි, දැනට විශ්‍රාමිකව සිටින කෙනෙක් මි. මා සේවයේ යෙදී සිටි කාලයේම ගුරුවරියකව සිටි දැනට විශ්‍රාමික කැතරින් නම් සුදු කාන්තාව මෑතකදී ශ්‍රීලංකාවට ගිය ගමකදී ලද අත්දැකීමක් මට කියූවාය. මේ ඒ කතාවයි.

කීප වතාවක් ලංකාවට ගොස් ඇති කැතරින් පසුගිය දෙසැම්බර් මාසයේ ද සිය බාල පුත්‍රයා සමග ලංකාවට ගියාය. සති තුනක් පමණ වූ ඒ සංචාරයේදී සතියක් පමණ බෙන්තොටද, දින දහයක් පමණ මහනුවර, නුවරඑළිය, සීගිරිය, පොලොන්නරුව සහ අනුරාධ පුරය රවුමට ගොස්, පුතාගේ පෙරැත්තය නිසා ඉතිරි කාලය මීගමුවේ ගත කළ බව පැවසුවාය. සමහර වෙලාවලදී කොටි බෝම්බ නිසා පුතාගේ ආරක්ෂාව ගැන තරමක චකිතයක් ඇති වුවද නිවාඩුව ප්‍රිය ජනක වූ බව කී ඇය, මේ වර ගමනේදී දුටු අපූර්ව දෙයක් මට විස්තර කළා ය.

නුවර ගිය විට දළදා මාලිගාවට ද ගිය ඔවුන් පසුව මාලිගය අවට ඇවිදින්නට ගොස් ඇත. මාලිගාව පිටුපස දේවාලයක් ළඟම පිට්ටනියක සිටි අලියෙ-ක්ද, එහි රැස්ව සිටින පිරිසක්ද දැක ඔව්හු කුතුහලයෙන් එදෙසට ගියෝය.

අලියාගේ කකුල් හතරටම දම්වැල් දමා, බිම ශක්තිමත් ලෙස සවිකරන ලද කොකු හතරකට හතර පැත්තට දම්වැල් දමා බැඳ තිබිණ. එසේ අලියාට යන්තම් අඩියක් පමණ කකුල් සෙලවීමට ඉඩක් තිබුණු අතර, උගේ බෙල්ලෙන්ද දම්වැලක් දමා ගැටගසා තිබී ඇත. ඇත්ගොව් වාද හෙණ්ඩුවක් අතැතිව අලියා ළඟ සිටි අතර, එතැනට දෙමව්පියන් හෝ බාරකරුවන් සමග එන කුඩා ළමයින් සඳහා මුදලක් අයකොට ළමයින් තනි තනිව අලියාගේ බඩ යටින් රිංගවා යවන්නට ඔහු සැලැස්වූ බව කැතරින් මට කීවාය. බොහෝ ළමයින් ඉතා ආශාවෙන් එසේ ගියද සමහර ළමයින් බිය වූ විට දෙමා පියන් දෙමාපියන් පෙරැත්ත කොට එසේ යැවූ බවද පෙනී ඇත. දිගටම පැවති ගිනි අව්වේ මෙය නොකඩවා කෙරුණි. අලිකාරයාට මෙය මුදල් රැස්කර ගැන්මේ හොඳ මාර්ගයක් වීය.

දහවල් වනවිට තදබල අව් රස්නයෙන්ද, අලින්ගේ සාමාන්‍ය පුරුද්ද වන ගාත් සෙලවීම සීමා කරන ලද හෙයින්ද, වේදනාව නිසා අලියා අවිවේකී බවක් පෙන්නුම් කළ බවද, එවිට ඇත්ගොව්වා හෙණ්ඩුවෙන් ඇන අලියාගේ කණ ඇද, මුරගා මෙල්ල කළ බව ද ඇය කීවාය. මෙසේ කරන්නේ කුමක් නිස-ාදැයි කුතුහලයට පත්ව ළඟ සිටි ස්වදේශික යෙකුන් ඇසූ කළ ඔහු පිළිතුරු දී ඇත්තේ Blessings ආශිර්වාද සඳහා බවය. කැතරින් සහ ඇගේ පුත්‍රයා මේ සිද්ධිය දැක කිසියම් කලකිරීමකට හා කම්පනයකට පත්ව තිබේ. එයට පෙර දින නුවරට එන ගමනේදී පින්නවල අලි අනාථාගාරයට ගොස් එහි සිටි අලින් දැක, උන්ට දක්වන සැලකිලි සහ ඔවුන්ගේ කෙළිසෙල්ලම් බලා ඒවා ගැන පැහැදී පැමිණ සිටි මේ දෙදෙනාට මෙතැන අලියෙකුට කරන මේ හිරිහ-ැරය ගැන අදහාගත නොහැකි වී ඇත. ආපසු එන ගමනේදී ඔවුන් ලංකාවේ සිටි මුළු කාලයේම සේවය කළ රියැදුරාට මේ පුවත කියා සංවේගය පළකළ විට ඔහු අනේ මැඩම් ඒ දුප්පත් ඇත්ගොව්වන් කීයක් හරි හොයා ගන්න තමයි ඒවා කරන්නේ යයි කී බවද ඇය කීවාය.

එංගලන්තයට ආපසු මේ ගැන මගෙන් විමසන්නට ඇය ඉටාගෙන ඇත. බුද්ධාගම දැඩි පැහැදීමක්ද, පොත් පත් කියවා ලත් දැනුමක්ද ඇති කැතරින් සත්ව කරුණාවට අප ආගමේ විශේෂ තැනක් දී ඇති බවද දනී. දළදා මාලිගාව වැනි ශ්‍රේෂ්ඨ සිද්ධස්ථානයක බිමේ එවැනි හිංසාකාරී කටයුත්තකට ඉඩදී ඇත්තේ වෙන විශේෂ හේතුවක් නිසාදැයි ඇය මගෙන් ඇසුවාය.

පෙනෙන නොපෙනෙන, දුර නුදුර සිටින, අති විශාල ප්‍රමාණයේ සිට කුඩා ප්‍රාණියා දක්වාම, සියළු සතුන්ට පමණක් නොව වෘක්ෂ ලතා ආදිය පවා හිරිහැර විනාශයන්ට පත්කිරීමෙන් වලකින ලෙසද, ඒ සැමට මෛත්‍රී කරන ලෙසද ප්‍රකාශ කළ, ඒ අනුවම ක්‍රියා කළ බුදුපියාණන්ගේ ධර්මයේ විශේෂයෙන් කරණීය මෙත්ත සූත්‍රයේ දක්වා ඇති දේ ඇයට පැහැදිලි කළ මම, මේවා පසු කාලයක සංවිධිත සියළු ආගම් තුළට මෙන්ම බුදු දහමටද රිංගා ඇති මිත්‍යා විශ්වාස නිසා සිදුවන දේ බවද ඇයට පැහැදිලි කර දුනිමි.

කෙසේ වුවද බෞද්ධ ලෝකයේ මුදුන් මල්කඩක් වශයෙන් සැලකෙන, සකල බෞද්ධයින්ගේ ගෞරවාදරයට පාත්‍රවූ ශුද්ධභූමියක මේ ආකාරයේ හිංසාකාරී දේවල් කිරීමට ඉඩහැරීමෙන් අප රට ගැනත්, අප ආගම ගැනත් පහැදීමක් ඇති අය අතරේද කලකිරීම් ඇතිවීමට ඉඩ තැබීම වැරදිය.

අස්ගිරි මල්වතු මහනා හිමිවරුන්ගේත්, දැල බණ්ඩාර දියවඩන නිළමේ තුමන්ගේත් අවධානය මේ කෙරෙහි යොමුවේවායි! මේ වෙසක් සමයේ ප්‍රාර්ථනා කරමි.

♦ **විපුල ඒකනායක**
**East London, UK**



**Boris Jonson**



**Ken Livingstone**

# ලන්ඩන් නගරාධිපති තරඟයේ සීරියස් මිනිහා පැරදවූ ජෝකර්

**ගි**ය සතියේ පැවති ලන්ඩන් නගරාධිපති තරඟයේ දී දීර්ඝ කාලයක්, එනම් පිට පිට දෙවරක්ම නගරාධිපති ධූරය ඉසිලූ බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂයේ කෙනත් ලිවිංස්ටන් මහතා පරදා කොන්සර්වේටිව් පක්ෂයේ බොරිස් ජොන්සන් මහතා නව නගරාධිපති ලෙස තේරී පත් විය. මාස ගණනක් විවිධ ප්‍රචාරක කටයුතු යටතේ දියත්වුණු මෙම නගරාධිපති තරඟය අවසන් වටය වන විට ඉතා උණුසුම් තත්වයකට පෙරලිණ. මුලින් මුලින් කෙන් දිනන ලකුණු පෙනුණ නමුත් අවසානය කාලය වන විට කෙන් බොරිස් අතර පරතරය කෙමෙන් වැඩි විය. අවසාන දිනය වනවිට කෙන් පරදින බව සැබැවින්ම කවුරුත් දැන සිටියෝය.

ලන්ඩනයට වඩා සේවයක් කරන්නට බලාපොරොත්තු වන්නේ කවුරුද යන්න ගැන දෙදෙනා අතර ටෙලිවිෂන් සහ පුවත් පත් වාද ඇතිවිය. දැනට ලන්ඩන් නගරයට පිවිසීම සඳහා රථවාහන වලට අයකරන ජදබට්‍ැඑසදබ ජය්රට්‍ැ හෙවත් තදබද ගාස්තු තවත් වැඩිකරන බව කෙන් පැවසූ විට එයම ඔහුගේ අවාසියට හේතු විය. එසේම දැනට ලන්ඩනයේ දිනපතා වැඩිවන අපරාධ සංඛ්‍යාවද කෙන්ගේ ජනප්‍රියත්වය පිරිහීමට හේතුවකි.

බොරිස් ජොන්සන් ටෙලිවිෂන් හාස්‍යය දනවන වැඩසටහන්වල පෙනී සිටි අවස්ථා බොහෝ ය. එය මුල්කර ගෙන කෙන්ගේ පිල "ජෝකර් කෙනෙකුට ඡන්දෙ දෙන්න එපා, සීරියස් ලෙස ලන්ඩනය ගැන හිතන කෙන්ට ඔබේ ඡන්දය දෙන්න" යනුවෙන් පෝස්ටර් ද ගැසීය. අවසාන සති දෙකට පෙර කෙන් ලිවිංස්ටන් ලන්ඩනයේ කොටි ත්‍රස්ත වාදීන් විසින් පිළියෙල කරන ලද රැස්වීමකට ද සහභාගි වී කතා කළේය. කෙන් කරගත් ලොකුම වැරැද්ද එයයි. අවසානයේ **සීරියස් කෙන්** පරදා **ජෝකර් බොරිස්** දිනීය.

# කෝපි පැකට්ටුවට බුදුරුව යෙදීම ගැන Tesco සමාව ඉල්ලයි!

**එ**ක්සත් රාජධානියේ සුප්‍රකට වෙළඳ ආයතනයක් වන ටෙස්කෝ **(Tesco)** සිය වෙළඳ ශාඛාවල අලෙවිකරන කෝපි පැකට්ටුවලට බුද්ධරූපය යෙදීම ගැන ශ්‍රීලාංකික යින්ගෙන් ලැබුණු පැමිණිලි නිසා වහා ක්‍රියාත්මක වූ ලන්ඩනයේ ශ්‍රීලංකා මහකොමසාරිස් කාර්‍යාලය ඒ ගැන ටෙස්කෝ සමාගමට දැඩි අප්‍රසාදය පළකළේය. ඊට ප්‍රතිචාර දක්වමින් ටෙස්කෝ සමාගම සමාව අයැදිමින් නියෝජ්‍ය මහකොමසාරිස් සුදන්ත ගනේගමආරච්චි මහතාට පහත සඳහන් ලිපිය එවා ඇත. බුදුරුව සහිත කෝපි පැකට්ටුව වෙළඳ හල් රාක්ක වලින් අස්කරගත් බවත්, එය යළිත් කිසිදා තම ශාඛාවන්හි නොවිකුණන බවත් ටෙස්කෝ සමාගම එහි අවධාරණය කර ඇත.

Cirrus Building A
Shire Park
Welwyn Garden City
Hertfordshire AL7 1GA

21 April 2008

S.S.Ganegama Arachchi
High Commission for the Democratic
Socialist Republic of Sri Lanka
13 Hyde Park Gardens
London W2 2LU

**Dear Mr Arachchi,**

**Tesco Java Sumatra Roast & Ground Coffee**

I would like to assure you that there was absolutely no intention to cause any offence through the use of an image of **Lord Buddha** on this product.

In the case of the Java Sumatra coffee, the image is meant to represent that region of Indonesia. It was never meant to imply any religious endorsement and **we would apologise if that impression has been given.**

I have arranged for the labelling of the product to be changed and the image of Lord Buddha removed. In the meantime if you any questions please do not hesitate to contact me.

Yours sincerely
**Mark Moss**
Trading Law & Technical



# කෙන් ලිවිංස්ටන්ගේ පරාජයෙන් අද ලොවට දේශපාලන පාඩමක්




**කෙ**න් ලිවිංස්ටන් කියන්නෙ කවුද කියලා එංගලන්තෙ ඉන්න අය දන්නවා. ඔහු ගැන නොදන්නා මේ තීරුව කියවන අය ගැන හිතලා කෙන් ගැන කරන කෙටි විස්තරයක් මේ. කෙන් ලිවිංස්ටන් සමාජ වාදී පිළේ දේශපාලකයෙකු ලෙසයි කව දත් හැඳින්වූවේ. කෙනත් රොබට් ලිවිංස් ටන්, ලන්ඩනයේ ලැම්බර්ත් කියන පළා තෙ 1945 දි උපන්නෙ. මව වෘත්තීය නැටුම් ශිල්පිනියක්. පියා වෙළඳ නැවක සේවය කළ නාවිකයෙක්. කෙන් ම කියන විදියට දෙමාපියන් ධනපති අදහස් තිබුණු කම්කරු පන්තියෙ අය. කෙන් ඉගෙනුම ලැබුවෙ නැගණහිර ලන්ඩනයෙ තුල්ස් හිල් හි සාමාන්‍ය පාසැලක. ඔහු යාන්තම් අධ්‍යාපන පොදු සහතික පත්‍ර විභාගය සමත් වුණා. පාසැලෙන් අස්වී පිළිකා පර්යේෂණ ආයතනයක කාර්මිකයෙකු ලෙස සේවය කළා. ඔහු ගුරුවරයෙකු වීමටද පුහුණුව ලැබුවා. එහෙත් ගුරුවෘත්තියෙ යෙදුනෙ නැහැ.

1968 කෙන් බ්‍රිතාන්‍ය ලේබර් හෙවත් කම්කරු පක්ෂයට බැඳුණා. ඒ කාලෙ ලේබර් පක්ෂයේ ජනප්‍රියත්වය පහළට වැටෙමින් තිබුණෙ. කෙන් වැනි තරුණ අය අවශ්‍ය වුණා. ඔහුගෙ තිබුණු ඉදිරියට කඩාගෙන යාමේ තරුණකම නිසාම ලේබර් ප්‍රාදේශීය ශාඛාවෙ ඔහුට මුල් තැනක් අත් වුණා. 1971 දී කෙන් ලැම්බර්ත් ප්‍රාදේශීය සභා නියෝජිතයෙක් ලෙස තේරුණා. 1973 දී ලන්ඩන් මහ නගර සභාවෙ නියෝජිතයෙකු ලෙස නෝර්වුඩ් ආසනයෙන් තේරී පත්වුණා. නගර සභාවෙ ඔහු විවිධ වැදගත් තනතුරු හෙබවූවා. 1978 දී කෙන් ලිවිංස්ටන් උතුරු ලන්ඩනයේ හැම්ප්ස්ටඩ් ආසනයේ පාර්ලිමේන්තු නියෝජිතයා ලස තේරුණත් 1979 මහමැතිවරණයේදී ඔහු පරාජය වුණා. එහෙත් ඔහු 1981 දී ලන්ඩන් නගර සභාවට තේරී පත්වුණා. ලේබර් පක්ෂයට නගර සභාවෙ වැඩි බලපය ලැබුණු නිසා කෙන් ලිවිංස්ටන් ලන්ඩන් මහ නගර සභාවෙ නායකයා වුණා.

ඔහු ඒ තනතුරේ ඉඳ බොහොම හොඳ වැඩත් කළා. මහ ආණ්ඩුවෙ නීති වලට පටහැනිව ලන්ඩනයේ බස්ගාස්තු, දුම්රිය ගාස්තු ඉතා පහළටම බලෙන් අඩු කළා. මාග්‍රට් තැචර් රජය ඊට එරෙහිව උසාවි ගියා. කෙන් තැචර්ට රිද්දවන පුදුම දේවල් කළා. ලන්ඩනයේ ඔහු විවිධ විරෝධතා පෙළපාලි සංවිධානය කළා. බැරිම තැන තැචර් රජය කළේ ලන්ඩන් නගර සභාව විසුරුවා හැරීම. පාලනය වෙනම කමිටුවකට පැවරුණා.

1997 දී ලේබර් පක්ෂය දිනලා ටෝනි බ්ලෙයාර් අගමැතිවුණා. යළිත් ලන්ඩන් නගර සභාව ඇති කළා. 2000 දී නගරාධිපති කෙනෙක් පත් කරන ඡන්දයක් පැවැත්වුවත් ලේබර් පක්ෂය කෙන්ට නාමයෝජනා දුන්නෙ නැහැ. ඒත් කෙන් වෙනම ඉල්ලලා දිනුවා. ලන්ඩනයේ නගරාධිපති වුණා. 2004 දී පැවති නගරාධිපති තරඟයෙන්ද දිනලා යළිත් කෙන් ලන්ඩන් නගරාධි පති ලෙස තේරුණා. මේ 2008 දි ගිය සතියේ ඔහු නගරාධිපති තරඟයෙන් පැරදුණා. ඊට හේතුවයි දැන් මං කියන්නෙ.

කෙන් ලේබර් පක්ෂයේ හිටියට පක්ෂයේ නායකත්වය විවේචනය කළා. ඇත්ත වශයෙන් ම ලේබර් පක්ෂයේ බොහෝ දෙනා ඔහුට කැමති නැහැ එදා ඉඳලම. කෙන් වැඩ කළේ හිතු මනාපෙට. ඔහු විවාදාත්මක දේ කළා. ටෝනි බ්ලෙයාර් වරක කිව්වා කෙන් ලිවිංස්ටන් නගරාධිපතිවීම ලන්ඩන් නගරයට මහා විනාශයක් කියලා. ලේබර් පක්ෂයේ සාමාජිකයෙක් ගැන ලේබර් අගමැතිම එහෙම කියන්නෙ හේතුවක් ඇතිව විය යුතුයි. **IRA** ත්‍රස්තවාදය ලන්ඩනය පුරා මහ ඉහළින් තිබෙන කාලෙ කෙන් ඒ ත්‍රස්තවාදී නායකයෙක් වන ජෙරී ඇඩැම්ස් සහ තව ඒ වගේ කීප දෙනෙක් අයර්ලන්තයේ සිට ලන්ඩනයට ගෙනැත් පිළිගැනීමේ උත්සව යක් තියන්න සූදානම් කළා. බ්‍රිතාන්‍ය රජයේත් මහජනතාවගේත් අප්‍රසාදය නිසා ඒ වැඩේ හරිගියේ නැහැ. කෙන් ඒ පාර කළේ තනිවම අයර්ලන්තයට ගිහිං ඒ **IRA** පිරිස මුණ ගැසී ඔවුන්ගේ ව්‍යාපාරයට සහයෝගය දැක්වීම. මේ වරත් කෙන් ඒ වගේ දෙයක් කළා. ඒ තමයි ලන්ඩනයේ දෙමළ කොටි ත්‍රස්ත වාදීන් සමග මිත්‍රවීම. ඔහුගේ පරාජයට ඒක ලොකු හේතුවක්.

ලන්ඩනයේ ඉන්න කොටියන්ද කොටියන් නොවන දෙමළ අයද සේරම එකතු වෙලා මේ වර කෙන්ට ගිහිල්ලා කිව්වා අප ළඟ ලාංකික දෙමළ ඡන්ද මේ ලන්ඩනයේ දහස් ගණනක් තියනවා. ඒ සේරම ඔබටයි. කෙන් හිතුවා මේක හොඳ පල්ලම. කෙන් ඒ දෙමළ අය ඒ ඒ ආසනවල ඡන්ද නියෝජිතයන් කළා. කොටි ගෙවල්වලට කැන්වස් කරන්නත් ගියා. බ්‍රිතාන්‍යයේ පුවත් පත් කීපයකම පළවුණා කෙන්ගේ කොටි සමග ඇති සම්බන්ධ කම. කොටියන්ට ඕන කළේ කෙන් නගරාධිපති වුනාම කොටි තහනම මේ රටෙන් ඉවත් කරගන්න. ඊට පස්සෙ ලන්ඩනයේ හිතේ හැටියට බඩ පිණුම් ගහන්න. ඒ සේරම වැරදුණා.

ලන්ඩනයේ සිටින සිංහළ මිනිස්සු සියළු දෙනාම කෙන්ට විරුද්ධව බොරිස් ජොන්සන්ට ඡන්දය දුන්නෙ. මේවර අපිට දකින්න ලැබුණු සිංහල මිනිස්සුන්ගෙ ලොකුම එකමුතුකමක් ඒක. කෙන් වගේ අය වාමාංශිකයො හැටියට පෙනී ඉඳලා ඡන්ද වාසිය තකා ත්‍රස්ත්වාදයට උදව්කරනවා නම් ඒ වාමාංශිකකම අමු බොරුවක්. කෙන්ගෙ දේශපාලනය මෙතනින් ඉවර බව පේනවා. මින් ඉගනගන්න තියන පාඩම මේකයි. කොටින්ට කිට්ටු වන ඕනම කෙනෙකුට අත්වෙන්නෙ අන්තිමට විනාසය.

♦ **වෙලේගෙදර රාළ London**